ප.පා.දෙ—ජී.ඒ. 19/39.

## 1952කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන "සම්මත අතුරු ව්‍යවස්ථා" පනතේ 3 වැනි වගන්තිය යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ උතුරු බින්තැන්න ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර, මෙයින් පළකර සිටිනු ලැබේ.

**"යෝජනාව"**

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට, උතුරු බින්තැන්න ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ජේ. සී. අප්පුහාමි,
සභාපතිතැන.

1965 අගෝස්තු මස 26 දින,
මහඔය, උතුරු බින්තැන්න ගම්සභා කාර්යාලයේදිය.

9–1099—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## 1952කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත්පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩදුම්බර හසලක ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කර ගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

**යෝජනාව**

පළාත්පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1953 නේ අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 නේ අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දා වූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට අංක 37 දක්වා වූ කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට හසලක ගම්සභාව විසින් පළාත්පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

වයි. ඇම්. ගුණතිලක,
හසලක ගම්සභාවේ සභාපති.

1965 අගෝස්තු 25 වැනි දින,
හසලක ගම්සභා කාර්යාලය,
පල්ලේවත්ත.

9–1120—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## 1952කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන "පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා" පනතේ 3 වෙනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ මැද දුම්බර මැදසියපත්තුව ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මතකර තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

**යෝජනාව**

පළාත් පාලනය කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවකින් අනුමත කරන ලද බව 1963 ජූනි මස 21 වෙනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයකින් ප්‍රකාශ කරන ලද්දාවූද, සම්මත පොදු අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩය මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මතකර ගැනීමට මැද දුම්බර මැදසිය පත්තුව ගම්සභාව විසින් පළාත් පාලන ආයතන "පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා" පනතේ "261 වෙනි අධිකාරය" 3 වැනි වගන්තියේ පළමුවෙනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඒ. ඩබ්ලිව්. මිල්ටන් ධම්මවර්ධන,
"මැදූ" මැදිසියපත්තුව ගම්සභාවේ සභාපති තැන.

වර්ෂ 1965 ක්වූ අගෝස්තු මස 23 වෙනි දින,
මැදමහනුවර, අම්බාලේ,
මැදසියපත්තුව "මැදූ" ගම්සභා කාර්යාලයේදීය.

9–1127—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ ගඟල උඩසිය පත්තුව ගම් ප්‍රදේශයේ ගම්සභාව මගින් සම්මතකරගෙණ තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර, මෙයින් පළකර සිටිනු ලැබේ.

**යෝජනාව**

පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරණු ලැබ 1963 ජූනි මස 21 දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරණ ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරණ ලද බව 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරණ ලද්දාවූද, පොදු අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩය. මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැණීමට ගඟල උඩසිය පත්තුව ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණතේ (261 වැනි පරිච්ඡේදයේ) 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ආර්. එම්. පිකිරි බණ්ඩා,
ගඟල උඩසිය පත්තුව ගම්සභාවේ සභාපතිතැන.

1965.9.1 දින,
ගඟල උඩසිය පත්තුව ගම්සභා කාර්යාලයේදීය,
කඹුරව,
තලාගොඩ (හන්දිය),
මාතලේ.

9–1106—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශී අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ ආඬිගම ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළ කර සිටිනු ලැබේ.

**යෝජනාව**

පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදනය කරණු ලැබ 1953 නේ අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරණ ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරණ ලද බව 1953 නේ අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශකරණ ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වා වූ කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කරගැනීමට ආඬිගම ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

පී. ඇම්. පුන්සිරි,
ආඬිගම ගම්සභාවේ සභාපති.

වර්ෂ 1965 අගෝස්තු මස 30 වැනි දින,
ආඬිගම ගම්සභා කාර්යාලයේදී,

9–1101—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

(ඉහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරන කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදෙයි )

සටහන.—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරී" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත් කර ගනු ලබන නිලධාරීන් ය.

**5. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

**6. සේවා මුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවා මුක්ත වූ අයදුම්කරුවන්ට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවලට නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

**7. වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

8. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය පාලන මණ්ඩලයේ සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාහරින්නට තමන් සූදානම් ව සිටින්ද නැද්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

**(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත්** නොගැළපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) අයදුම්පත් වනාහි මීට යාකොට ඇති ආකෘතියට සාරානුකූලව පිළියෙල කොට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපැල්දී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

**ස. යු.—(i)** අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නාමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්‍රවලට ඈමිණිය යුතුය (1) ඉංග්‍රීසි-සිංහල, දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වෙනම වෘත්තීය ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

————තනතුර සඳහා වූ අයදුම්පතයි

**1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය:** ————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැදහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස :

අවුරුදු——, මාස———, දින———.

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පියා පස මුත්තා :————.
(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි).

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා,* විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
| --- | --- | --- |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම්, ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය යම් කලක නතර කරන ලද්දේ නම් එසේ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු), පළාත් පාලනායතන හා කාල සීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය : ————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත හටයෙක් නම් :—

සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශෙෂ ජයග්‍රහණ ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————. (ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### II වැනි ශ්‍රේණියේ පුහුණු රසායනාගාර සේවක තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත්‍ර කැඳවයි.

2. වැටුප.—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 750—13×42—රු. 1,296.

3. ඉල්ලුම් කිරීමට සුදුස්සන් :

(අ) වයස.—1965 ඔක්තෝබර් 12 දිනට වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුයි. (උප්පැන්න සහතිකයෙහි පිටපතක් ඇමිණිය යුතුයි).

(ආ) (i) අර්ධ පුහුණු ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවු. 5 ක සේවයක් ඇති කොළඹ නගර සභාවේ සේවකයන් (සහතික පිටපත් ඇමිණිය යුතුයි).

නැතහොත්

(ii) විද්‍යා විෂයයන් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රයෙන් සමත් වී ඇති අය (සහතික පිටපත් ඇමිණිය යුතුයි).

(ඉ) ජලභීතිකාරෝග නාශක එන්නත් බෙහෙත් පිළියෙළ කිරීම, පශු වෛද්‍ය රසායනාගාරයක ක්ෂුද්‍රජීව විද්‍යා කටයුතු සඳහා උපකරණ පිළියෙල කිරීම හා ඒවායෙහි විෂබීජ විනාශ කිරීම රසායනාගාර වැඩවලට ගන්නා කුඩා සතුන් පරීක්ෂණයන් සඳහා පිළියෙළ කිරීම හා ජලභීතිකා රෝග නාශක බෙහෙත් එන්නත් කිරීමේ කටයුතුවලට සහායවීමේ පළපුරුද්දක් ද තිබිය යුතුයි. (සහතික පිටපත් ඇමිණිය යුතුයි.)

4. මේ ගැසට් පත්‍රයේ iv වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 1965 ඔක්තෝබර් 12 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

6. අයදුම්පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ, ඒවා සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලන ආයතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාර දී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. සුදුසු ඉල්ලුම්පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන්සභාවේ සභාපති.

1965 සැප්තැම්බර් මස 15 දින,
තැ. පෙ. 530, කොළඹ.

9–1109—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

### කර්මාන්ත ඉංජිනේරු තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත් කැඳවයි :—

2. (i) වැටුප් ක්‍රමය.—පහත 3 (අ) ඡේදයේ සුදුසුකම් ලත් අය සඳහා වර්ෂයකට රු. 5,160—360×9—480×1—රු. 8,880කි.

(ii) පහත 3(ආ) ඡේදයේ සුදුසුකම් ලත් අය සඳහා වර්ෂයකට රු. 4,080—360×6—රු. 6,240කි.

3. අයදුම්කරුවෝ පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුය :—

(අ) රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, ඉංජිනේරු (සිවිල්) හෝ සහකාර ඉංජිනේරු තනතුරට උසස් කිරීමේ විභාගයෙන් සමත් වී සිටීම.

(ආ) ලන්ඩන්, සිවිල් ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය සඳහා ඒ.ඇම්.අයි.සී.ඊ. විභාගයේ ඒ සහ බී කොටස් දෙකින් සමත්වීම හෝ, පිළිගත් විශ්ව විද්‍යාලයක බී.ඇස්.සී. (ඉංජිනේරු) උපාධිය ලබා සිටීම.

4. පළාත් පාලන සේවයේ හෝ ආණ්ඩුවෙන් විශ්‍රාම ලබා ඇති ඉංජිනේරුවරුන්ගෙන්ද ඉල්ලුම් පත් භාරගනු ලැබේ. එවැනි අයෙකු තෝරාගනු ලැබුවේ නම් ඔහුට අවුරුදු 2 ක කාලයකට විශ්‍රාම රහිත වැටුපක තබනු ඇත. එම කාලසීමාවෙන් ඔබ්බට සේවයේ තබා ගැනීම පසුව සලකා බලනු ලැබේ. ලැබී ඇති සුදුසුකම් සහ පළපුරුද්ද අනුව ඉහත 2 (i) ඡේදයේ වැටුප් ක්‍රමය වැටුපක එවැනි අය තබනු ඇත.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම්පත් පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙළ කොට 1965.10.12 දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

එහි 16 වැනි ඡේදය මෙසේ සංශෝධනය විය යුතුය :

"16. (අ) කාර්මික සුදුසුකම් පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

(ආ) සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳව ඇති පළපුරුද්ද පිළිබඳව සම්පූර්ණ විස්තර :————."

7. අයදුම් පතක් තැපෑලේදී නැතිවූ බවට, ප්‍රමාදවූ බවට කෙරෙන කිසිම චෝදනාවක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වන තුරු අයදුම්පත් එවීම ප්‍රමාද කරන අපේක්ෂකයෝ තුමූම එවැනි අවදානමකට මුහුණ දෙති.

8. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

9. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් භාරගනු ලබන්නේ ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

10. සුදුසුකම් ලත් සියලුම අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බව සතියක් තුළදී දන්වා එවනු ලැබේ.

පළාත් පාලන කොමිෂන් සභාවේ
සභාපති.

තැ. පෙ. 530,
කොළඹ, 1965 සැප්තැම්බර් 17 දින දීය.

9–1108—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### II වැනි ශ්‍රේණියේ ජලකර්මාන්ත වැද්දුම්කරු තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. වැටුප.—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 666—42×16—රු. 1,338. රු. 1,086 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිම.

3. අවශ්‍ය සුදුසුකම් :

(අ) වයස.—1965.10.12 දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවන්ට, වාත්තු කළ යකඩ, ගැල්වනයිස් යකඩ හා එස්-ලොන් පී. වී. සී. ප්‍රධාන ජලනල තබත්තු කිරීම හා ප්‍රකෘතිමත් කිරීම, ප්‍රධාන ජලනල වලින් පෞද්ගලික ජල සේවාවන් සැපයීම, අළුත් වැල්ව් සවි කිරීම හා අළුත්වැඩියා කිරීම, ජලනල සවිකිරීම හා සම්බන්ධ කිරීම පිළිබඳ පළපුරුද්ද තිබිය යුතුය. ලංකා කාර්මික විද්‍යාලයේ දෝනා වැඩ පිළිබඳ සහතිකය ඇත්තන් ගැන විශේෂ සැළකිල්ල දැක්වේ.

4. මේ ගැසට් පත්‍රයේ iv වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙළ කොට 1965.10.12 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

6. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලන ආයතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාර දී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. සුදුසු ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 530, කොළඹ,
1965 සැප්තැම්බර් මස 16 දින.

9–1110—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### වින්නඹු මාතා තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත්‍ර කැඳවයි.

2. වැටුප.—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය—රු. 666—42×15 රු. 1,296. රු. 1,086 යන වාර්ෂික වැටුපට කාර්යක්ෂමතා කඩයිමකි.

3. අවශ්‍ය සුදුසුකම්.—(අ) වයස. 1965.10.12 දිනට වයස අවුරුදු 50ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවෝ පහත සඳහන් විභාගවලින් සමත් විය සිටිය යුත්තාහ :—

අපේක්ෂිකාවන් සිංහල කණිෂ්ඨ පාඨශාලා සහතික විභාගය සමත් ලියාපදිංචි කරන ලද වින්නඹු මාතාවන් විය යුතු අතර, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගෙන් ලබාගත් ප්‍රවීණතා සහතික යත් ඔවුන්හට තිබිය යුතුය. සෞඛ්‍ය මණ්ඩල වැඩ ගැන පළපුරුද්දක් ඇති සිංහලෙන් හා දෙමළෙන් කථා කළ හැකි අය කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වේ.

4. මේ ගැසට පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම්පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1965.10.12 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

6. අයදුම්පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ **පෞද්ගලික නමට නොවේ.**

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. සුදුසු ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 530, කොළඹ,
1965 සැප්තැම්බර් මස 14 වැනි දින.

9–1112—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### පොදු සෞඛ්‍ය සේවිකා තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. වැටුප.—තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය :

(i) වර්ෂයකට රු. 2,220න් පටන්ගෙන, වර්ෂයකට රු. 120 බැගින් 10 වරක් වැඩිවී, රු. 3,420 දක්වා නගී. එහි රු. 2,820 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩ ඉමකි. මේ වැටුප් ක්‍රමය පහත 3 (අ) ඡේදයෙහි සඳහන් සුදුසුකම් ඇති පුහුණු වූ පොදු සාත්තු සේවිකාවන් සඳහාය.

(ii) වර්ෂයකට රු. 1,320—72×12—රු. 2,184 වැටුප් ක්‍රමය : එහි රු. 1,608 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමයි. මේ වැටුප් ක්‍රමය පහත 3 (ආ), (ඇ) ඡේදවල සඳහන් සුදුසුකම් සහිත සේවිකාවන් කෙරෙහි අදාළ වෙයි.

තෝරාගනු ලබන අපේක්ෂිකාවෝ ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව, ඔවුනට අදාළ වැටුප් ක්‍රමයෙහි සුදුසු පියවරක පිහිටුවනු ලබති.

3. **අවශ්‍ය සුදුසුකම්.—**

(අ) සාමාන්‍ය සාත්තු සේවිකා සහතිකය, වින්නඹු සේවිකා සහතික සහ පොදු සෞඛ්‍ය සේවිකා සහතිකය, හෝ

(ආ) සාමාන්‍ය සාත්තු සේවිකා සහතිකය සහ වින්නඹු සේවිකා සහතිකය, හෝ

(ඇ) සාමාන්‍ය සාත්තු සේවිකා සහතිකය (සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතුයි.)

4. අපේක්ෂිකාවන් පත්කරනු ලබන ප්‍රාදේශීය බලමණ්ඩල මගින් නොමිලයේ නිල ඇඳුම් සපයනු ලැබේ. ඒ ප්‍රාදේශීය බලමණ්ඩලවල සීමාවන් ඇතුළත පදිංචි වන ලෙස ඔවුන්ට නියම කරනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර පත්කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙලකොට, 1965 ඔක්තෝබර් මස 12 වැනි දිනට හෝ ඊට ප්‍රථම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

සඳහන් කරන ලද ආකෘතියෙහි 13 වැනි අංකය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.—

**විශේෂ සුදුසුකම් :**

(i) සාත්තු සේවය පිළිබඳ ඇති සුදුසුකම්වල විස්තර,

(ii) පුහුණුවූ පොදු සෞඛ්‍ය සාත්තු සේවිකාවක්ද යනු,

(iii) වින්නඹු කර්මය පිළිබඳ පුහුණුව ලබා තිබේද ?

7. අයදුම් පතක් තැපැල්දී නැතිවූ බවට, ප්‍රමාදවූ බවට කෙරෙන කිසිම චෝදනාවක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු අයදුම්පත් එවීම ප්‍රමාද කරන අපේක්ෂකයෝ තුමූම එවැනි අවදානම කට මුහුණ දෙති.

8. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

9. අවශ්‍ය සාත්තු සේවිකා සහතිකවල පිටපත් සහ උප්පැන්න සහතිකයේ පිටපත් ද නොමැතිව ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

10. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

11. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දින සිට සති 1ක කාලය ඇතුළතදී සුදුසුකම් ඇති අයදුම් පත් පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1965 සැප්තැම්බර් මස 18 දින,
තැ. පෙ. 530,
කොළඹ.

9–1107—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### පියැදුරු—යාන්ත්‍රික තනතුරු—ජලකර්මාන්ත

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. වැටුප.—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය—රු. 876—42×14—රු. 1,464. මේ වැටුප් ක්‍රමයේ රු. 1,170 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිමකි.

3. **අවශ්‍ය සුදුසුකම් :**

(අ) වයස 1965.10.12 දිනට වයස අවුරුදු 40ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවනට—

(i) සෑම වර්ගයකම කුඩා තෙල් ඇන්ජින්, විදුලිය මෝටර් යන්ත්‍ර, කේන්ද්‍රාපසාරී හා ගැඹුරු ළිං පොම්ප වැඩ පිළිබඳ අවුරුදු 5ක පළපුරුද්ද තිබිය යුතුයි;

(ii) ඩීසල් හෝ විදුලි බලයෙන් ක්‍රියා කරවන පොම්ප ක්‍රියා කරවීම හා නඩත්තු කිරීම පිළිබඳ දැනුමක් තිබීම ;

(iii) දෝෂ සොයා දැන ගැනීමට හා ඒවා හරිගැස්සීමට හැකියාවක් තිබීම ;

(iv) කාබන් කැඩීමේ හෝ වෙනත් නියමිත වැඩ කිරීමට හා නඩත්තු වැඩ හා අවශ්‍ය අමතර කොටස් ඉල්ලුම්කර සිටීමට හැකියාවක් තිබීම ;

(v) පොම්පය කාර්යක්ෂමව ක්‍රියා කරවීමට සහ/හෝ පණ ගැස්වීමට හැකියාවක් තිබීම.

(ඇ) විට්‍රි සහ අනික් ක්ලෝරිනේටර් පාලනය, ක්ලෝරයිත් තෙල්, විදුලිය හා ජලය පරිභෝජන ප්‍රමාණය සටහන් කිරීමේ හැකියාවක් ද අයදුම්කරුවන්ට තිබිය යුතුයි.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1965.10.12 වැනි දිනට හෝ ඊට පළමු මා වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

6. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලන ආයතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාර දී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. සුදුසු ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1965 සැප්තැම්බර් මස 16 දින,
තැ. පෙ. 530, කොළඹ.
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

9–1111—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### මුරකරු තනතුර—රාස්සගල ගම් සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රුපියල් 540—30 × 8—24 × 1—රුපියල් 804. රු. 636 සහ රු. 732 වාර්ෂික වැටුප්වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

3. **අවශ්‍ය සුදුසුකම් :—**

(අ) **වයස.**—1965.10.12 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු, 40ට නොවැඩි විය යුතුයි ;

(ආ) අපේක්ෂකයෝ සිංහල 5 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුත්තාහ. දෙවැනි භාෂාව පිළිබඳ ක්‍රියාත්මක දැනීමක් අතිරේක සුදුසුකමක් වනු ඇත. හොඳ ශාරීරික පෙනුමකින් යුක්ත විය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බල මණ්ඩලවල සථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම්පත්‍ර, ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළ කර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම්පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1965.10.12 වැනි දිනට හෝ ඊට පළමු රාස්සගල ගම් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

ක. පියදාස,
රාස්සගල ගම්සභාවේ සභාපති.

1965 සැප්තැම්බර් මස 7 වැනි දින,
රාස්සගල ගම්සභා කාර්යාලයේ දී ය.

9–7[illegible]0—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

### පළාත් පාලන ලිපිකරු සේවයට බඳවා ගැනීමේ විභාගය—1965 ඔක්තෝබර් 2

1965 ජූලි 30 වැනි දින දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ සිව් වැනි කොටසේ පළ කරන ලද 1965 ජූලි 24 වැනි දාතමින් යුත් ඉහත සඳහන් විභාගය පිළිබඳ නිවේදනයට වැඩිදුරටත් ය.

1965 ඔක්තෝබර් 2 වැනි දින පැවැත්වීමට නියමිතව තිබුණු පළාත් පාලන ලිපිකරු සේවයට බඳවා ගැනීමේ විභාගය 1965 නොවැම්බර් මස 20 වැනි දිනට කල් දමා ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

විභාග ප්‍රවේශ පත්‍ර යථා කාලයේදී අපේක්ෂකයින් වෙත නිකුත් කරනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
**සභාපති.**

1965 සැප්තැම්බර් මස 20 වැනි දින,
තැ. පෙ. 530, කොළඹ.

9–1140—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ඞී.—ඕ. 6/64.

## පේදුරුතුඩුව නගර සභාව

### නගර සභා ආඥාපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 153 වැනි සහ 156 වැනි වගන්ති යටතේ පේදුරුතුඩුව නගර සභාව විසින් සම්පාදිතව, ඒ ආඥාපනතේ 154 වැනි වගන්තියෙන් තමා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත්පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා—

පළාත් පාලන අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1965 සැප්තැම්බර් මස 8 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

පහත සඳහන් ව්‍යාපාර අන්තරායදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

(1) කෙඳි වගී නෙලීම හෝ ගබඩා කිරීම
(2) කොප්පරා සෑදීම හෝ ගබඩා කිරීම
(3) යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් හිඳීම
(4) කපාපු පොල් සකස් කිරීම
(5) සවර්ණාභරණ සෑදීම සඳහා ප්‍රදර්ශනාගාර සහිතවූ ආයතනයක් පවත්වාගෙන යෑම
(6) මුද්‍රණාලයක් පවත්වාගෙන යෑම
(7) කම්මලක් හෝ පට්ටලයක් සඳහා ප්‍රදර්ශනාගාර සහිතවූ ආයතනයක් පවත්වාගෙන යෑම
(8) වෙළඳාම සඳහා පිදුරු ගබඩා කිරීම
(9) වෙළඳාම සඳහා ගෝනි ගබඩා කිරීම
(10) වෙළඳාම සඳහා ගැලුම් 50කට වැඩි ප්‍රමාණයක පොල්තෙල් ගබඩා කිරීම
(11) හාල්මෝලක් හෝ හාල් පාහින යන්ත්‍රයක් පවත්වාගෙනයෑම.
(12) වෙළඳාම සඳහා ගැලුම් 25 කට වැඩි ප්‍රමාණයක භූමිතෙල් ගබඩා කිරීම
(13) මෝටර් රථ වාහන අළුත්වැඩියා කිරීම හෝ " සර්විස් " කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම
(14) ප්‍රදර්ශනාගාරයක් සහිතවූ වඩුවැඩ පොළක් පවත්වාගෙන යෑම
(15) බයිසිකල් අළුත්වැඩියා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම
(16) සෙක්කුවෙන් පොල්තෙල් හිඳීම

(17) සෙක්කුවෙන් තලතෙල් හිඳීම

(18) විදුලිය වැඩ පොළක් පවත්වාගෙන යෑම

(19) වෙළඳාම සඳහා පොල්අතු ගබඩා කිරීම

(20) අම්ලකර වායුව පාවිච්චි කරන ගරාජයක් පවත්වාගෙන යෑම

(21) වෙළඳාම සඳහා දැව දඬු ගබඩා කිරීම.

(22) සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම

(23) වෙළඳාම සඳහා දර ගබඩා කිරීම

(24) බැටරි චාජ්කිරීම

(25) යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන ලී ඉරන මෝලක් පවත්වාගෙන යෑම

(26) යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන ලී ඉරන මෝලක් පවත්වාගෙන යෑම

(27) ටයර් සහ ටියුබ් වල්කනයිස් කරන ස්ථානයක් පවත්වාගෙන යෑම

(28) පැට්‍රෝල් හා/හෝ භූමිතෙල් ගබඩාවක් පවත්වාගෙන යෑම.

2. පහත සඳහන් ව්‍යාපාර අප්‍රශන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුයි :—

(1) පොහොර සෑදීම

(2) සතුන්ගේ ලේ හෝ අතුණු බහන් උණු කිරීම

(3) මේදය පෙරීම හෝ සෑදීම

(4) සබන් සෑදීම

(5) පොල්ලෙලි පෙඟවීම් සඳහා (පොල්ලෙලි) කොටුවක් පවත්වාගෙන යෑම

(6) උම්බලකඩ ගබඩා කිරීම

(7) වෙළඳාම සඳහා හොන්ඩර 2 කට වඩා වැඩි ප්‍රමාණයක මාලු ගබඩා කිරීම හා/හෝ වියළීම

(8) හුණු, සතුන්ගේ හම්, ඇට කටු, කෘත්‍රිම පොහොර වැනි හෝ කෘත්‍රිම පොහොර සෑදීම පිණිස පාවිච්චි කරනු ලබන ද්‍රව්‍ය හොන්ඩර 10 කට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම

(9) මාලු අයිස් දැමීම

(10) එළුවන් 15 දෙනෙකුට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ අංගනයක් පවත්වාගෙන යෑම

(11) යන්ත්‍රානුසාරයෙන් තුනපහ වැනි ඇඹරීම

(12) බිඩි සෑදීම

(13) ලෝහමය උපකරණ සුන්බුන් ගබඩා කිරීම

(14) වෙළඳාම සඳහා පොල්කටු අඟුරු ගබඩා කිරීම

(15) වෙළඳාම සඳහා දහයියා ගබඩා කිරීම

(16) ඇසිටික් ඇසිඩ් ගැලුම් 4 කට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම

(17) සුරුට්ටු සෑදීම

(18) දුම්කොළ හෝ සුරුට්ටු ගබඩා කිරීම

(19) ගෝ ඝාතක ස්ථානයක් පවත්වාගෙන යෑම

(20) එළවළු හෝ පලතුරු කඩයක් පවත්වාගෙන යෑම

(21) රෙදි පිරිසිදු කරන ස්ථානයක් පවත්වාගෙන යෑම

(22) බේකරියක් පවත්වාගෙන යෑම

(23) අයිස් ක්‍රීම් සෑදීම

(24) කුකුළු, තාරා දී පක්ෂීන්ගේ හා/හෝ සතුන්ගේ ආහාර සඳහා ගබඩාවක් පවත්වාගෙන යෑම.

3. පහත සඳහන් ව්‍යාපාර අන්තරායදායක වූ සහ අප්‍රසන්නවූ ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුයි :—

(1) ගඩොල් හෝ උළු සෑදීම

(2) හුණු පිච්චීම හෝ වියළා සකස් කිරීම

(3) හැලි වලං සෑදීම

(4) ගඩොල්, කබුක්ගල්, උළු හෝ කළුගල් ගබඩා කිරීම

(5) යන්ත්‍රානුසාරයෙන් කළුගල් කැඩීම

(6) හිස් බෝතල් ගබඩා කිරීම

(7) තීන්ත වැනි හෝ වාර්නිෂ් ගබඩා කිරීම

(8) සිල්ලර බඩු ගබඩා කිරීම

(9) සිමෙන්ති කොට්ට උර 25 කට වැඩියෙන් ගබඩා කිරීම

(10) රබර් ටයර් සහ ටියුබ් 20 කට වැඩියෙන් ගබඩා කිරීම

(11) ඡායා රූප ශාලාවක් පවත්වාගෙන යෑම

(12) ලී බඩු සෑදීම හෝ ගබඩා කිරීම

(13) ධාන්‍ය වැනි, ඇට වැනි හෝ පිටි ගෝනි 25 කට වැඩි ගණනක් ගබඩා කිරීම

(14) හාල් සහ/හෝ පිටි හා/හෝ වී ගෝනි 50 කට වැඩියෙන් ගබඩා කිරීම

(15) බාබර් සාප්පුවක් පවත්වාගෙන යෑම

(16) පොල්කටු හෝ පොල්කටු අඟුරු පිච්චීම

(17) කොහු හෝ කොහු භාණ්ඩ සෑදීම හෝ ගබඩා කිරීම

(18) ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ වැඩපොළක්

(19) විදුලිය කම්බි දැමීමේ ස්ථානයක්

(20) බෙලෙක් වැඩ කිරීමේ ස්ථානයක්

(21) වෙළඳාම සඳහා හැළි වලං ගබඩා කිරීම.

-10 97 —65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ජී—බී 28/64

## චාවකච්චේරි නගර සභාව

### නගර සභා ආඥාපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තිය යටතේ චවාකච්චේරි නගර සභාව විසින් සම්පාදිතව, 154 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 සැප්තැම්බර් මස 8 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

1. පහත සඳහන් ව්‍යාපාර අන්තරායදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතු යි :—

කෙඳි වර්ග ගබඩා කිරීම හෝ නෙළීම

කොප්පරා සෑදීම හෝ ගබඩා කිරීම

මෝලෙන් හෝ සෙක්කුවෙන් පොල් තෙල් හිඳීම

කපාපු පොල් සකස් කිරීම

පූළුන්, කපු පූළුන් හෝ පිදුරු ගබඩා කිරීම

තල තෙල් හිඳීම

ගිනි කූරු සෑදීම

ලී ඉරණ මෝලක් පවත්වාගෙන යාම

ජල බලයෙන්, වාෂ්ප බලයෙන් හෝ වෙනත් යාන්ත්‍රික බලයකින් දැව දඬු හෝ ලී ඉරීම

මහා මාර්ගයකින් යාර සියයක් ඇතුළත පිහිටි මඩුවක කොප්පරා වියලා සකස් කිරීම

ගෝනි ගබඩා කිරීම

තෙල් ගබඩා කිරීම

කොහු හෝ කොහු වලින් හෝ කෙඳි වලින් සාදන ලද භාණ්ඩ ගබඩා කිරීම

විදුලි කර්මාන්ත වැඩ පොළක් පවත්වාගෙන යාම

මුද්‍රණ යන්ත්‍රාලයක් පවත්වාගෙන යාම

සවර්ණාභරණ සෑදීම පිණිස ආයතනයක් පවත්වාගෙන යාම

කම්මලක් පවත්වාගෙන යාම

රෙදි අපුල්ලන ස්ථානයක් පවත්වාගෙන යාම

වඩු කර්මාන්ත වැඩ පොළක් පවත්වාගෙන යාම.

2. පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම

පුවක් වියලා සකස් කිරීම

සතුන්ගේ ලේ හෝ අතුණු බහන් උණු කිරීම

පොල් ලෙලි පෙඟවීම සඳහා (පොල් ලෙලි) කොටුවක් පවත්වාගෙන යාම

උම්බලකඩ ගබඩා කිරීම (හොන්ඩර 5කට වැඩි ප්‍රමාණයක්)

ලුණු මාලු ගබඩා කිරීම (හොන්ඩර 3කට වැඩි ප්‍රමාණයක්)

කරවල ගබඩා කිරීම (හොන්ඩර 3කට වැඩි ප්‍රමාණයක්)

ලී ඉරණ මෝලක් පවත්වාගෙන යාම

මාලු වියලා සකස් කිරීම, වියලීම හෝ අයිස් දැමීම

මස් වියලීම හෝ වියලා සකස් කිරීම

මිරිස් කුඩු සෑදීම

බුරුසු සෑදීම

යන්ත්‍රානුසාරයෙන් මිරිස් කුඩු ඇඹරීම

අඟුරු සඳහා ලී හෝ පොල් කටු පිච්චීම

එළවන් දහදෙනෙකුට වඩා වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ අංගනයක් පවත්වාගෙන යාම

යන්ත්‍රානුසාරයෙන් වී, කුරක්කන්, තිරිඟු හෝ වෙනත් යම් යම් ධාන්‍ය වර්ග ඇඹරීම

සුරුට්ටු සෑදීම

ලෝහමය භාණ්ඩ සුන්බුන් ගබඩා කිරීම

කෝල් කටු අඟුරු ගබඩා කිරීම

රබර් සහ ටියුබ් වල්කනයිස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම

ඇසිටික් ඇසිඩ් ගබඩා කිරීම (ගැලුම් 12කට වැඩි ප්‍රමාණයක්).

3. පහත සඳහන් ව්‍යාපාර අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය:—

ගඩොල් හෝ උළු පිච්චීම

හුණු පිච්චීම හෝ සකස් කිරීම

මේධය හෝ මේධ තෙල් උණු කිරීම

ගඩොල්, කබුක්ගල්, උළුහෝ කලුගල් ගබඩා කිරීම

පොල් තෙල් ගැලුම් පනහකට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම

යන්ත්‍රානුසාරයෙන් කලුගල් කැඩීම

9–1098—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඕ.—බී. 19/64

## සුළු නගර සභා ආඥාපනත

(256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 සහ 156 යන වගන්ති යටතේ, කන්තලේ සුළු නගර සභාව මගින් සම්පාදනය කරන ලදුව ඒ ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලනය පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹදීය.

අතුරු ව්‍යවස්ථා

## වැසිකිළි ශෝධනය

1. කන්තලේ සුළු නගර සභාව විසින් පිළිගනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවල, 19 වැනි කොටසේ 6 වැනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා සුළු නගර සභාව වෙත මාස්පතා ගෙවිය යුතු වැසිකිළි ශෝධන ගාස්තුව ශෝධනය කරනු ලබන එක් එක් බාල්දිය වෙනුවෙන් රුපියල් එකයි ශත පනහ බැගින් විය යුතුය.

2. අංක 1 දරන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගාස්තුව එය අයවිය යුතු මාසය ලඟට එළඹෙන මාසයේ දහවෙනි දින හෝ ඊට කලින් ගෙවිය යුතුය.

9–1100—65.9.24 දින අංක 14,513 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඕ.—බී 18/63
ප.පා.කො. බීඩී/ඊ/1/2/1

## සුළු නගර සභා ආඥාපනත

